සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

21 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**
❖ **නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.**

01. පහත සංකල්ප වලින් සාර්ව ආර්ථික විද්‍යාවට අයත්වන සංකල්පය වන්නේ,
1. ආන්තික පිරිවැය
2. ආයතනයක නිෂ්පාදන පිරිවැය
3. ආර්ථික උත්පාන සහ අවපාත
4. විකල්ප අතරින් තේරීම
5. වෙළඳපොලේ පාරිභෝගික හැසිරීම (..........)

02. පහත සඳහන් දෑ අතරින් ප්‍රාග්ධනය සඳහා ඇතුලත් නොවන පිළිතුර හඳුනාගන්න.
1. වීවගා කල වෙල්යායක්
2. බර අදින අලියෙක්
3. පොල් වගාවක්
4. තේ වගාවක්
5. විදුලි උත්පාදන යන්ත්‍රයක් (..........)

03. පහත සඳහන් සම්පත් වලින් භූමිය සඳහා ඔබ ඇතුලත් කරන සම්පත් වර්ගය වන්නේ,
1. ළිඳකින් ලබාගන්නා ජලය
2. සංවහන වර්ෂාව
3. සතුන්
4. බඩ ඉරිඟු වගාවක්
5. ගස්වැල් (..........)

04. සමාජ ප්‍රාග්ධනය යනුවෙන් අදහස් වන්නේ,
1. සමාජය සතු දැනුම හා කුසලතා සම්භාරයයි.
2. මානව ප්‍රාග්ධනයේ වර්ධනයයි.
3. මිනිසා විසින් නිෂ්පාදිත නිෂ්පාදන ආධාරක ප්‍රමාණය
4. සමාජයේ අන්තර් පුද්ගල සම්බන්ද්තා හා ප්‍රතිමානවේ.
5. නිෂ්පාදන පිරිවැය අඩුකරන යටිතල පහසුකම් ප්‍රමාණයයි. (..........)

05. වෙළඳපොල අසාර්ථකවීම යනුවෙන් අදහස්වන්නේ,
1. වෙළඳපොල ආර්ථිකය සැලසුම් ආර්ථිකයට මාරුවන තත්ත්වයකි.
2. වෙළඳපොල බලවේග මගින් සම්පත් කාර්යක්ෂමව බෙදා නොහරිනු තත්ත්වයකි.
3. ඉල්ලුම් හා සැපයුම් සමාන නොවන තත්ත්වයකි.
4. මධ්‍යගත සැලසුම් ආර්ථිකයක ඇති තත්ත්වයකි.
5. වෙළඳපොළ ආර්ථිකය හා රජයේ කාර්ය ඉටුනොකරන තත්ත්වයකි. (..........)

06. ආර්ථික පද්ධතියක් තුළ කුටුම්බ අංශය, ව්‍යාපාර අංශය සහ රාජ්‍ය අංශය කටයුතු කරනු ලබන්නේ නම් එම ආර්ථික පද්ධතිය ඔබ හඳුනාගන්නේ,
1. සම්ප්‍රදායික ආර්ථික පද්ධතියක් ලෙසය
2. ධනවාදී ආර්ථික පද්ධතියක් ලෙසය.
3. මිශ්‍ර ආර්ථික පද්ධතියක් ලෙසය
4. සමාජීය වෙළඳපොල ආර්ථික පද්ධතියක් ලෙසය.
5. විධානගත ආර්කථි පද්ධතියක් ලෙසය (..........)


07. වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් බලවේග මත තීරණය වන මිල මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳන අර්ථ ක්‍රමය වන්නේ,

1. නිදහස් ව්‍යවසාය අර්ථ ක්‍රමයකි.
2. විධාන ගත අර්ථ ක්‍රමයයි.
3. මිශ්‍ර අර්ථ ක්‍රමයයි.
4. සමාජවාදී වෙළඳපොල අර්ථ ක්‍රමයයි.
5. සමාජීය වෙළඳපොල අර්ථ ක්‍රමයයි. (..........)

08. වෙළඳපොළවල පවත්නා අපූර්ණ තොරතුරු පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කරමින් ආර්ථික ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම කිරීම සඳහා රජය මැදිහත්වන අර්ථක්‍රමය හඳුනාගන්න.

1. සැලසුම් ආර්ථික
2. වෙළඳපොල ආර්ථික
3. සමාජීය වෙළඳපොල ආර්ථික
4. සමාජවාදී වෙළඳපොල ආර්ථික
5. සංඥක සැලසුම් කරණ ආර්ථික (..........)

09. පහත දැක්වෙන්නේ නිෂ්පාදන හැකියා වක්‍රයක් නිෂ්පාදන ස්ථානය A සිට B දක්වා වෙනස් වී ඇති ආකාරයයි. එසේ නිෂ්පාදනය වෙනස්වීමේදී ඔබට එකඟවිය හැකි ප්‍රකාශය වන්නේ,




1. ආවස්ථික පිරිවැයක් හට ගනී.
2. ආර්ථික ප්‍රතිගමනයකට මුහුණ දී සිටී.
3. ආර්ථික අවපාතයකට මුහුණ දී සිටී.
4. සේවා නියුක්තිය වැඩි වී තිබේ.
5. කාර්යක්ෂම ආර්ථිකයක් වී තිබේ. (..........)

10. වැඩෙන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා වක්‍රයක සිරස් අක්ෂයේ පාරිභෝජන භාණ්ඩ සහ තිරස් අක්ෂයේ ප්‍රාග්ධන භාණ්ඩ නිපදවන බව සිතන්න. මායිම මත කටයුතු කරන මෙම ආර්ථිකයේ නිෂ්පාදනය ස්ථානය සිරස් අක්ෂය දෙසට ගමන් කලවිට එරට,

| අනාගත ජීවන තත්ත්වය | ආර්ථික වෘද්ධිය |
|---|---|
| 1. ඉහළ යය | පහළ යයි |
| 2. පහළ යයි | ඉහළ යයි |
| 3. ඉහළ යයි | ඉහළ යයි |
| 4. පහළ යයි | මන්දගාමීව ඉහළයයි |
| 5. පහළ යයි | සීඝ්‍ර වර්ධනය ඇතිවේ. |

(..........)

11. කිසියම් භාණ්ඩයක් සඳහා පවතින ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීම සඳහා බලපාන සාධකයක් වන්නේ,

1. අනුපූරක භාණ්ඩ මිල පහළ යාමයි.
2. ආදේශන භාණ්ඩ මිල ඉහළ යාමයි
3. රජය විසින් ඉල්ලුම් කරුවන් වෙන සහනාධාර සැපයීමයි.
4. සලකා බලන භාණ්ඩයේ මිල පහළ යාමයි.
5. බාල භාණ්ඩයක් නම් ආදායම ඉහළ යාමයි. (..........)

12. කිසියම් භාණ්ඩයක් සම්බන්ධව සැපයුම් සමීකරණයක් $Qs = -200 + 20P$ ලෙස සලකන්න. එවැනි සමීකරණයකට අදාල සැපයුම් වක්‍රයේ නම්‍යතාවය පිළිබඳව ඔබට එකඟවිය හැකි ප්‍රකාශය වන්නේ,

1. සැපයුම නම්‍යවන අතර මිල පහළ යන විට නම්‍යතාවය ඉහළ යයි.
2. සැපයුම අනම්‍ය වන අතර මිල ඉහළ යන විට නම්‍යතාවය පහළ යයි.
3. සැපයුම අනම්‍ය වන අතර මිළ ඉහළ යන විට නම්‍යතාවය ඉහළ යයි.
4. සැපයුම නම්‍යවන අතර මිල ඉහළ යන විට නම්‍යතාවය ඉහළ යයි.
5. සැපයුම නම්‍ය වන අතර මිල වෙනස්වීමේදී නම්‍යතාවය ස්ථාවරව පවතී. (..........)

13. කිසියම් භාණ්ඩයක් සඳහා වන සැපයුම් වක්‍රය නොවෙනස්ව පැවතීමට බලපාන්නේ පහත කවර සාධකයක් වෙනස් වූ විටක දීද?

1. යෙදවුම් මිල 2. තාක්‍ෂණ දියුණුව 3. රජයේ බදු පැනවීම
4. එම භාණ්ඩයේ මිල 5. නිෂ්පාදකයින් සංඛ්‍යාව (..........)

14. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් සමීකරණය Qd = 250 – 25 P වන අතර මෙම භාණ්ඩයේ මිල රු. 4.00 වූ විටක දී පාරිභෝගික අතිරික්තයේ අගය කොපමණ වේද?

1. රු. 1600 ක් වේ. 2. රු. 35 ක් වේ. 3. රු. 1250 ක් වේ.
4. රු. 450 ක් වේ. 5. රු. 1050 ක් වේ. (..........)

15. සහල් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය -0.8 ලෙස සලකන්න . නිෂ්පාදකයින් විසින් සහල් මිල 50% කින් ඉහළ දැමීමට තීරණය කලේ නම් ඉල්ලුම් ප්‍රමාණය කොපමණ ඉහළ හෝ පහළ යන හැතිද

1. 40% කින් පහළ යයි. 2. 40% කින් ඉහළ යයි. 3. 80% කින් ඉහළ යයි.
4. 80% කින් පහළ යයි. 5. 25% කින් ඉහළ යයි. (..........)

16. එක්තරා ආයතනයක නිපදවන භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය - 0.6 ක් වේ යැයි උපකල්පනය කර ඇත. මෙම ආයතනය භාණ්ඩයේ සැපයුම වැඩි කිරිමට තීරණය කලේනම් ආයතනයේ නිෂ්පාදන අයභාරය,

1. ඉහළ යයි. 2. නොවෙනස්ව පවතී. 3. පහළ යයි.
4. 60% කින් ඉහළ යයි. 5. 60 % කින් පහළ යයි. (..........)

17. කිසියම් භාණ්ඩයක සැපයුම් සමීකරණය QS = -200 + 10 P වේ . මෙම භාණ්ඩයේ සැපයුම් සමීකරණය QS = -100+10P ලෙස වෙනස් වූයේ නම් ඒ සඳහා බලපෑහැකි සාධානය වන්නේ,

1. භාණ්ඩය සඳහා රජය බද්ධක් පනවා ඇති බවයි.
2. භාණ්ඩය සඳහා රජයේ සහනාධාර කපා ඇති බවයි.
3. භාණ්ඩය නිපදවන නිෂ්පාදකයින් වැඩිවී ඇති බවයි.
4. භාණ්ඩයේ යෙදවුම් මිල ඉහළ ගොස් අති බවයි.
5. භාණ්ඩ නිපදවීමේදී අයහපත් දේශගුණයක් පැවති බවයි. (..........)

18. Qd = - 200 + 5 P සමීකරණයට අදාල භාණ්ඩයේ මිල රු. 80 ක් වන විට නිෂ්පාදන අතිරික්තයේ ප්‍රමාණය කොපමණ වේද?

1. 16000 ක් වේ. 2. 4000 ක් වේ. 3. 8000 ක් වේ.
4. 6000 ක් වේ. 5. 3000 ක් වේ. (..........)

19. සමතුලිත පොල් වෙළෙඳපොලක ඉල්ලුම හා සැපයුම යන දෙකම වැඩිවූ විටක සමතුලිත මිලට හා ප්‍රමාණයට සිදුවන බලපෑම නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන්නේ,

1. සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.
2. සමතුලිත මිල වැඩිවන අතර ප්‍රමානය ඉහළ හෝ පහළ යා හැකිය.
3. සමතුලිත මිල නොවෙනස්වන අතර ප්‍රමාණය ඉහළයයි.
4. සමතුලිත මිල ඉහළ යන අතර ප්‍රමාණය පහළ යයි.
5. සමතුලිත ප්‍රමාණය වැඩිවන අතර සමතුලිත මිල වෙනස්වීම නිශ්චිතව කිව නොහැකිය. (..........)


20. $Q_2d = 20 – 2P$

$Qs = -4 + 2P$ මෙම සමීකරණ වලට අදාල වෙළඳ පොලේ සමතුලිත මිල හා ප්‍රමාණය වන්නේ,

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| 1. | රු. 6.00 | ඒකක 12 |
| 2. | රු. 5.00 | ඒකක 10 |
| 3. | රු. 4.00 | ඒකක 12 |
| 4. | රු. 6.00 | ඒකක 8 |
| 5. | රු. 8.00 | ඒකක 12 |

(..........)

21. පහත දැක්වෙන්නේ සහල් සඳහා වන සමතුලිත වෙළඳපොල තත්ත්වයකි. එහි මුළු ආර්ථික අතිරික්තය කොපමණ වේද?




1. රු. 3600 2. රු. 7200 3. රු. 1800
4. රු. 2600 5. රු. 4200 (..........)

22. පහත දැක්වෙන්නේ භාණ්ඩයක් සැපයුම් ලේඛනයකි. මෙම ලේඛනයට අදාල සැපයුම් සමීකරණය වන්නේ,

| P | Qs |
|---|---|
| 80 | 900 |
| 70 | 800 |
| 60 | 700 |
| 50 | 600 |

1. QS = -100 + 10 P 2. QS = 100 + 10 P 3. QS = 900 + 10 P
4. QS = 600 + 10 P 5. QS = 200 + 10 P (..........)

23. තරගකාරී වෙළෙඳපොලක සමතුලිත මිල පහළට යාමට පහත හේතු අතරින් කවරක් හේතුවේද?
1. ඉල්ලුම පූර්ණ අනම්‍ය විටකදී රජය විසින් නිෂ්පාදන සහනාධාර සැපයීම.
2. ඉල්ලුම පූර්ණ නම්‍ය විටකදී රජය විසින් නිෂ්පාදන බදු පැනවීම.
3. සැපයුම පූර්ණ නම්‍යවිටකදී අනුපූරක භාණ්ඩ මිල ඉහළයාම.
4. ඉල්ලුම පූර්ණ අනම්‍ය විටකදී රජය විසින් නිෂ්පාදන බදු පැනවීම.
5. සැපයුම පූර්ණ නම්‍ය විටකදී ආදේශ මිල ඉහළ යාම (..........)

24. X භාණ්ඩය සඳහා වන සැපයුම් වක්‍රය පහත සමීකරණයෙන් දැක්වේ.
$QS = 5 P_X$ මෙම සමීකරණයෙන් දැක්වෙන භාණ්ඩයේ සැපයුම් මිල නම්‍යතාවය පිළිබඳව නිගමනය කළ හැක්කේ කුමක්ද?
1. සැපයුම් මිල නම්‍යතාවය 2.0 කි. 2. සැපයුම් මිල නම්‍යතාවය 0.1 කි.
3. සැපයුම් මිල නම්‍යතාවය 1.0 කි. 4. සැපයුම් මිල නම්‍යතාවය 0.0 කි.
5. සැපයුම් මිල නම්‍යතාවය 0.8 කි (..........)

25. ජංගම දුරකථන සඳහා මිල නම්‍යතාවය - 2.0 කි. දුරකථනයක මිල රු. 2000 ක් වන විට දුරකථන 300 ක් ඉල්ලුම් කරයි. දුරකථන මිල රු. 1500 ට අඩුකල විට දුරකථන කොපමණ ඉල්ලුම් කරනු ලැබේද?
1. ඒකක 150 2. ඒකක 600 3. ඒකක 500 4. ඒකක 900 5. ඒකක 450 (..........)

26. කිසියම් භාණ්ඩයක් සඳහා වන නම්‍යතාවය - 2.5 යැයි උපකල්පනය කරන්න. මෙම භාණ්ඩයේ මිල වැඩි කිරීමට නිෂ්පාදන ආයතනය තීරණය කලේ නම්, ආයතනයේ අයභාරය,
1. ඉහළ යයි. 2. පහළ යයි. 3. උපරිම වේ.
5. අවම වේ. 5. නොවෙනස්ව පවතී. (..........)

27. කිසියම් භාණ්ඩයක් සම්බන්ධ සමතුලිත වෙළඳපොලක සමතුලිත මිල ඉහළ ගොස් ඇති අතර සමතුලිත ප්‍රමාණය ද අඩුවී ඇත. ඒ සඳහා බලපෑ සාධකය හඳුනාගන්න.
1. භාණ්ඩයේ ඉල්ලුම පහළයාම 2. රජය විසින් උපරිම මිල නියම කිරීම.
3. නිෂ්පාදන සංඛ්‍යාව ඉහළ යාම. 4. රජය විසින් නිෂ්පාදන සහනාධාර කපා හැරීම.
5. රජය විසින් නිෂ්පාදන සහනාධාර සැපයීම (..........)

28. සැපයුම් කරුවෙකු තමා නිෂ්පාදනය කළ භාණ්ඩයක මිල රු. 100 ක සිට රු. 80 දක්වා පහළ දැමීමට තීරණය කලේ ඔහුගේ අලෙවි ආදායම වැඩි කරගැනීම සඳහාය. ඒ සඳහා එම භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාවය කෙබඳු එකක් විය යුතුද?

1. ඉල්ලුම් නම්‍යතාවය - 1.0 ක් විය යුතුය.
2. ඉල්ලුම් නම්‍යතාවය ශුන්‍ය විය යුතුය.
3. ඉල්ලුම් නම්‍යතාවය - 2.5 ක් විය යුතුය.
4. ඉල්ලුම් නම්‍යතාවය - 0.8 ක් විය යුතුය.
5. ඉල්ලුම් නම්‍යතාවය - 0.1 ක් විය යුතුය. (..........)

29. අන්නාසි සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය - 0.5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම භාණ්ඩය රු. 25 කදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 500 ක් වේ. අන්නාසි ගෙඩි ඒකක 300 ක් ඉල්ලුම් කරනු ලබන්නේ කවර මිලකදී ද?

1. රු. 45 ක දීය.
2. රු. 20 ක දීය.
3. රු. 40 ක දීය.
4. රු. 54 ක දීය.
5. රු. 50 ක දීය (..........)


30. භාණ්ඩ වෙළෙඳපොළක සැපයුම් සමීකරණය QS = a + bP වේ යැයි සිතන්න. මෙම භාණ්ඩය මත රු. 4.00ක ඒකක බද්දක් රජය අය කිරීමට තීරණය කළ හොත් සැපයුම් සමීකරණය කෙසේ වෙනස්වේද?

1. Qst = a +2bP
2. Qst = a +b(P+4)
3. Qst = a +b(P-4)
4. Qst = a – b (P-4)
5. Qst = a – b (P+4) (..........)

31. ආණ්ඩුව භාණ්ඩයක් මත ඒකක බද්ධක් පැනවුවද සමාජ සුබසාධනයට බලපෑමක් සිදු නොවන අවස්ථාව කුමක්ද?

1. ඉල්ලුම ඒකීය නම්‍ය වන විට
2. සැපයුම් නම්‍යතා සංගුණකය අපරිමිත වන විට
3. හරස් ඉල්ලුම් නම්‍යතාව ශුන්‍ය වන විට
4. බද්දේ බර මුළුමනින්ම පාරිභෝගිකයා දරණ විට
5. ඒකක බද්දේ ප්‍රමාණයෙන්ම සැපයුම් වක්‍රය වමට විතැන් වේ. (..........)

32.




ඉහත ප්‍රස්තාරයේ දැක්වෙන්නේ වෙළඳපෙපාල සමතුලිතතාව පවතින අවස්ථාවක රජය ඒකක බද්දක් පැනවූ විට වෙළඳපල ඇතිවූ වෙනස්වීමය. බද්දට පසු පාරිභෝගික වියදම, නිෂ්පාදකයාට ලැබෙන මිල, පාරිභෝගිකයා ගෙවන මිල කොපමණ වේද?

| | පාරිභෝගික වියදම (රු.) | නිෂ්පාදකයාට ලැබෙන මිල (රු.) | පාරිභෝගිකයා ගෙවන මිල (රු.) |
|---|---|---|---|
| 1 | 1200 | 16 | 20 |
| 2 | 2000 | 20 | 20 |
| 3 | 1440 | 16 | 24 |
| 4 | 1200 | 24 | 16 |
| 5 | 1440 | 24 | 16 |

(..........)

33. ඔබට එකඟවිය නොහැකි ප්‍රකාශය තෝරන්න.

ගැනුම්කරුවන් වෙත ඒකක බද්දක් පැනවූ විට,

1. එම භාණ්ඩයේ සැපයුම් වක්‍රයට කිසිදු බලපෑමක් ඇති නොවේ.
2. පැවති මිල ගණන් යටතේ ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
3. එම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය අඩුවේ.
4. එම භාණ්ඩයේ සැපයුම් වක්‍රය දකුණටත් ඉල්ලුම් වක්‍රය වමටත් විතැන්වේ.
5. නෛතික වශයෙන් බද්ද මුළුමනින්ම ගෙවනු ලබන්නේ ගැනුම්කරුය. (..........)

34. වෙළඳපලේ නම්‍ය සැපයුමක් හා අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයක් මිල රු. 10 දී සමතුලිත තත්ත්වයේ පවතී යැයි සිතන්න. මෙම භාණ්ඩය සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කරනු ලැබුව හොත් එමගින් වාසි ලැබෙන්නේ,

1. පාරිභෝගිකයින් පමණි.
2. නිෂ්පාදකයින් පමණි.
3. පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් එක සමාන ලෙසය.
4. නිෂ්පාදකයින්ට වඩා පාරිභෝගිකයින්ය.
5. පාරිභෝගිකයින්ට වඩා නිෂ්පාදකයින්ය. (..........)

35. කිසියම් කාලපරිච්ඡේදයක් තුළ X භාණ්ඩය සඳහා වෙළඳපල ඉල්ලුම් සහ සැපයුම් ලේඛනය පහත දැක්වේ.

| ඒකකයක මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 80 | 500 | 900 |
| 70 | 600 | 800 |
| 60 | 700 | 700 |
| 50 | 800 | 600 |
| 40 | 900 | 500 |

X භාණ්ඩය සඳහා ඒකකයකට රු. 20 ක සහනාධාරයක් නිෂ්පාදකයාට ලබාදුනහොත් නව සමතුලිත මිල වන්නේ,

1. රු. 40 කි. 2. රු. 50 කි. 3. රු. 60 කි. 4. රු. 65 කි. 5. රු. 80 කි. (..........)

36. යම් භාණ්ඩයක නිෂ්පාදකයින්ට විශේෂිත සහනාධාරයක් ලබාදුන් විට බිහිවන වෙළඳපල සමතුලිත නිමැවුම් ප්‍රමාණය ආකාර්යක්ෂම නිෂ්පාදන මට්ටමක් ලෙස හඳුන්වන්නේ ඇයි?

1. රජයට පිරිවැයක් දරන්නට සිදුවන නිසාය.
2. ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට වඩා වැඩිවීම.
3. සමාජය දරණ ආන්තික පිරිවැය එම ඒකකයන්හි ආන්තික ප්‍රතිලාභ ප්‍රමාණයට වඩා වැඩිවීම.
4. සහනාධාර සඳහා දරණ පිරිවැයෙහි ආවස්ථික පිරිවැයක් පැවතීම.
5. පාරිභෝගිකයාට අඩු මිලකට පෙරට වඩා වැඩි ප්‍රමාණයක් පරිභෝජනය කළ හැකිවීම. (..........)

37. තරගකාරී වෙළඳපලක චොකලට් පැකට්ටුවක් මිල හා ඒ ඒ මිල යටතේ සැපයුම්කරු වෙළඳපලට සැපයීමට අපේක්ෂා කරන ප්‍රමාණ පහත පරිදි වේ.

| මිල | 20 | 30 | 40 | 50 | 60 | 70 |
|---|---|---|---|---|---|---|
| සැපයුම් ප්‍රමාණය | 0 | 50 | 90 | 120 | 140 | 150 |

මෙම භාණ්ඩය මත ඒකකයක් සඳහා රු. 20 ක බද්දක් පැනවූ විට රු. 50 දී සැපයුම් ප්‍රමාණයක් බද්ද වෙනුවට රු. 20 ක සහනාධාරයක් සැපයූවිට රු. 50 දී සැපපයුම් ප්‍රමාණයක් කොපමණ වේද?

| | රු. 20 බද්දට පසු රු. 50 දී සැපයුම් ප්‍රමාණය | රු. 20 ක සහනාධාරයෙන් පසු රු. 50 දි සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 1 | 0 | 90 |
| 2 | 50 | 150 |
| 3 | 40 | 120 |
| 4 | 120 | 140 |
| 5 | 140 | 50 |

(..........)


38. පහත දැක්වෙන්නේ භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් වක්‍රවල සමීකරණයයි .

$Qd = 100 - 4P$

$Qs = -20 + 4P$ මෙම භාණ්ඩයේ වෙළඳපල මිල රු. 8.00 වූයේ නම් රු. 8.00 දී අධි ඉල්ලුම් ප්‍රමාණය කොපමණද?

1. 0 කි. 2. 15 කි. 3. 56 කි. 4. 40 කි. 5. 60 කි. (..........)

39. භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කිරීමෙන් පසු බිහිවන වෙළඳපොළ තත්ත්වයන් පහත රූප සටහනේ දැක්වේ.




උපරිම මිල නියම කිරීමෙන් පසු උපරිම මිල සාර්ථක ලෙස ක්‍රියාත්මක වූයේ නම්, නිෂ්පාදකයා ලබන අයභාරය සහ අධි ඉල්ලුම ඒකක කොපමණ වේද?

| | වෙළඳපල අධි ඉල්ලුම | නිෂ්පාදන අයභාරය |
|---|---|---|
| 1. | 20 | 350 |
| 2. | 75 | 525 |
| 3. | 15 | 600 |
| 4. | 40 | 525 |
| 5 | 35 | 280 |

(..........)

40. සහල් වෙළඳපලේ මිල උපරිමයක් රජය නියම කළහොත් එය අර්ථවත් කිරීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. අධි ඉල්ලුම් පාලනය කිරීම.
2. ආනයනය හා සලාක කිරීම.
3. සහල් මෝල් රජයට පවරා ගැනීම.
4. නිෂ්පාදකයින් වෙත අතුරු නිෂ්පාදන හඳුන්වා දීම.
5. ආනයනික තීරු බදු ඉහළ නැංවීම. (..........)


41. රජය භාණ්ඩයක් සඳහා අවම මිලක් නියම කිරීම නිසා,

1. අධි සැපයුමක් ඇති වේ.
2. අධි ඉල්ලුමක් ඇති වේ.
3. සමතුලිත මිල යටතේ වෙළඳාම සිදුවේ.
4. සැපයුම්කරුට එම මිලට තමන් කැමති ප්‍රමාණයක් අලෙවි කළ හැක.
5. පාරිභෝගික අතිරික්තය වැඩි වේ. (..........)

42. වෙළඳපලේ අලෙවි වන භාණ්ඩයක් සඳහා රජය විසින් අවම මිලක් නියම කර අතිරික්ත සැපයුම මිලට ගැනීමට තීරණය කළේ නම්,

1. පාරිභෝගික අතිරික්තය අඩු වී නිෂ්පාදන අතිරික්තය වැඩි වේ.
2. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය අඩුවේ.
3. පාරිභෝගික අතිරික්තය වැඩි වී නිෂ්පාදන අතිරික්තය අඩුවේ.
4. පාරිභෝගික අතිරික්තය වැඩිවීමට වඩා නිෂ්පාදන අතිරික්තය වැඩි වේ.
5. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය සමානව ඉහළ යයි. (..........)

43. පහත දැක්වෙන ප්‍රස්ථාර සටහනින් පෙන්නුම් කරන්නේ සමතුලිත වෙළඳපලේ භාණ්ඩයකට අවම මිලක් නියම කිරීමෙන් පසු ඇතිවන තත්ත්වයකි.




අවම මිලෙන් පසු වෙළඳපල සමස්ත සැපයුම 50 දක්වා අඩුකිරීමට නිෂ්පාදකයාට සිදුවූයේ නම් පහත කවර ප්‍රකාශයක් සත්‍ය වේද?

1. පාරිභෝගික අතිරික්තය ඉහළ නංවාගත හැක.
2. ඒකකයක් සඳහා ලැබෙන මිල ආන්තික පිරිවැයට සමාන වේ.
3. පාරිභෝගිකයින් රු. 10 මිල යටතේ ඒකක 50 මිලට මෙන් උපයෝගිතාවය උපරිම කරයි.
4. නිෂ්පාදකයින්ට ඒකක 50 ක් අලෙවි කිරීමෙන් ඒකකයකට රු. 15ක අතිරික්ත ලාභයක් ඉපයිය හැකිය.
5. නිෂ්පාදන අතිරික්තය වෙනසක් සිදු නොවුවද පාරිභෝගික අතිරික්තය පමණක් අඩුවේ. (..........)

44. නිෂ්පාදන ශ්‍රිතය සම්බන්ධයෙන් එකග විය නොහැකි ප්‍රකාශය තෝරන්න.
   1. යෙදවුම් ඒකකයකට ලබාගත හැකි සාමාන්‍ය නිමැවුම් ප්‍රමාණය පෙන්වයි.
   2. යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂනික සම්බන්ධතාව පෙන්වයි.
   3. කෙටිකාලයේදී ශ්‍රිතයේ ඇතුලත් විචල්‍ය යෙදවුම් වැඩිකිරීමෙන් නිෂ්පාදනය වැඩිකළ හැක.
   4. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය තුළ ස්ථාවර හා විචල්‍ය යෙදවුම් වර්ග දෙකක් ඇතුලත් වේ.
   5. තාක්ෂණය හා ආයතනයේ ධාරිතාව නොවෙනස්ව පවතී නම් යෙදවුම් හා නිමැවුම් අතර අනුලෝම සම්බන්ධතාවක් පෙන්වයි. (..........)

45. කෙටිකාලයේදී ස්ථාවර සාධකය සමග විචල්‍ය යෙදවුම් වැඩි කරන විට ආන්තික ඵලදාව උපරිම වීමෙන් පසු තවදුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කළ හොත්,
   1. ආන්තික පිරිවැය අඩු වේ.
   2. ආන්තික ඵලදාව ස්ථාවර වේ.
   3. සමාන්‍ය පිරිවැය වැඩි වේ.
   4. සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ යයි.
   5. සාමාන්‍ය ඵලදාව තවදුරටත් වැඩිවේ. (..........)

46. කෙටිකාලයේදී ආයතනයක් ස්ථාවර වත්කම් මිලට ගැනිම සඳහා දරණ වියදම්,
   1. සාමාන්‍ය ස්ථාවර පිරිවැයක් සේ සැලකිය හැකිය.
   2 මුළු ස්ථාවර පිරිවැයට එකතු වන්නක් සේ සැලකිය හැකිය.
   3. ගිළුණු පිරිවැයක් සේ සැලකිය හැකිය.
   4. ආර්ථික පිරිවැයක් සේ සැලකිය හැකිය.
   5. විචල්‍ය පිරිවැයක් සේ සැලකිය හැකිය. (..........)

47. දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ වැඩිවන පරිමාණානුකූල ඵලහට ගැනීම කෙරෙහි බල නොපාන සාධකයක් හඳුනා ගන්න.
   1. යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේ හැකියාව
   2. සමහර නිෂ්පාදන සාධක වෙනස් කළ නොහැකි බව.
   3. එක් වරක් පමණක් දැරිය යුතු වියදම් තිබීම.
   4. ශ්‍රම විභජනය මගින් විශේෂ ප්‍රාගුණ්‍ය කිරීමේ හැකියාව.
   5. නිෂ්පාදන සාධකවල අභ්‍යනනතාව හෙවත් නොබෙදිය හැකි යෙදවුම් තිබීම (..........)

48. සපත්තු නිෂ්පාදන ආයතනයක දිනකදී නිම වන සපත්තු කුට්ටම් ගණන 60 කි. එක් සපත්තු ජෝඩුවක මිල රු. 800 ක් වේ. සපත්තු නිෂ්පාදනයේදී සම් සඳහා රු. 32000 ක් ද ශ්‍රමික වැටුප් 1600 ක් ද ඉන්දන හා විදුලිය සඳහා රු. 500 ක ද අහිමි වූ වැටුප් ආදායම රු. 3500 ක් ද වේ. දිනක ගණකාධිකරණ ලාභය කොපමණ වේද?
   1. රු. 10400   2. රු. 18900   3. රු. 13900   4. රු. 1600   5. රු. 48000 (..........)

49. නිෂ්පාදන ආයතනයක වක්‍ර පිරිවැයෙහි සංරචකයක් නොවන්නේ මින් කවරක්ද?
   1. අහිමි වූ වැටුප් ආදායම
   2. නිෂ්පාදකයින්ට අහිමි වූ පොලී ආදායම
   3. ආර්ථික ක්ෂයවීම්
   4. ප්‍රාමාණික ලාභ
   5. ඉන්දන හා විදුලි වියදම් (..........)

50. කෙටිකාලයේදී නිෂ්පාදන ආයතනයක් භාණ්ඩ කිසිවක් නිෂ්පාදනය නොකරන්නේ නම්,
   1. මුළු පිරිවැය ශුන්‍ය වේ
   2. මුළු ස්ථාවර පිරිවයැ ශුන්‍ය වේ.
   3. මුළු විචල්‍ය පිරිවැය ශුන්‍ය වේ.
   4. ආවස්ථික පිරිවයැ ශුන්‍ය වේ.
   5. සාමාන්‍ය මුළු පිරිවැය ශුන්‍ය වේ. (..........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 21 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................. ආර්ථික විද්‍යාව II කාලය පැය තුනයි

❖ **"අ " කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද "ආ" උප කොටසෙන් අවම වශයනේ ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ උප කොටස

01). i. ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ප්‍රාග්ධනය යනුවෙන් කුමක් අදහස් වේද? ඒ සඳහා උදාහරණ මොනවාද? (ලකුණු 4)

iii. මානව ප්‍රාග්ධනය හා සමාජ ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. සම්පත් හිඟකම යනුවෙන් කුමක් අදහස් වේද? ඒ සඳහා බලපාන හේතු මොනවාද? (ලකුණු 4)

v. නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව යන්න නිර්වචනය කොට නිෂ්පාදන සාධකවල ඵලදායිතාව තීරණය කරන සාධක නම් කරන්න. (ලකුණු 4)

02). i. ආර්ථික පද්ධතියක් යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 2)

ii. ආර්ථික පද්ධතියක තීරණ ගන්නා පාර්ශව මොනවාද? (ලකුණු 2)

iii. වෙළඳපොල ආර්ථිකයක පවත්නා දුර්වලතා විමසන්න (ලකුණු 2)

iv. ආර්ථික පද්ධති පිළිබඳ නව ප්‍රවණතා මොනවාද? (ලකුණු 2)

v. වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය නිර්වචනය කර ඒ සඳහා බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 4)

vi. පහත දැක්වෙන සංකල්ප නිෂ්පාදන හැකියා වක්‍ර මගින් පැහැදිලි කරන්න.

අ) ආර්ථික කාර්යක්ෂමතාව

ආ) ආර්ථික පසුබැසීම

ඇ) ආර්ථික වෘද්ධිය

ඈ) දැඩි ඉඩෝරයක් නිසා නිෂ්පාදන හැකියාව (ලකුණු 8)

03). i. ඉල්ලුම් නීතිය යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)

ii. භාණ්ඩයක මිල ඉහළයනවිට සැපයුම් ප්‍රමාණය ඉහළයාමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. අනම්‍ය ඉල්ලුමක් පවතින අවස්ථාවක මිල හා පාරිභෝගික පැහැදම හැසිරෙන ආකාරය සංඛ්‍යාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 6)

iv. ගිෆන් භාණ්ඩ හා බාල භාණ්ඩ අතර වෙනස රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. සැපයුම් මිල නම්‍යතා තීරක මොනවාද? (ලකුණු 4)

04). Qd = 250 – 5P

Qs = 50 + 5P

i. ඉහත සමීකරණවලට අදාල භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය රූප සටහනක ඇතුලත් කරන්න. (ලකුණු 4)

ii. අධි ඉල්ලුම් සමීකරණය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 4)

iii. එම වෙළඳපලේ මුළු ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)

iv. රු. 8 දී අධි ඉල්ලුම් ප්‍රමාණය කොපමණද? (ලකුණු 2)

රු. 8 දී අධි ඉල්ලුම් මිල කොපමණද? (ලකුණු 2)

v. මෙම භාණ්ඩයේ උපරිම ඉල්ලුම් මිල ගණනය කරන්න (ලකුණු 2)

vi. ඉහත වෙළඳපලේ භාණ්ඩයට අදාළ සැපයුම් නම්‍යතාව පිළිබඳ අදහස් දක්වන්න (ලකුණු 2)

05). i. නිෂ්පාදන අතිරික්තය යනුවෙන් කුමක්ද අදහස් වේද?

රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. වෙළඳපොළ සමතුලිතය ඇති කොන්දේසි මොනවාද? (ලකුණු 4)

iii. Qd = 50 – 2P

Qs = - 10 + 2P

අ) සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)

ආ) මෙම භාණ්ඩයේ අවම සැපයුම් මිල ගණනය කරන්න. (ලකුණු 2)

iv. පහත සඳහන් සිද්ධි සමතුලිත සහල් වෙළඳපොලකට සිදුකරන බලපෑම රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

අ) පාන් මිල ඉහළ යාම

ආ) බත් පරිභෝජනය කරන අය වැඩිවීම.


ඇ) සහල් සඳහා රජය නිෂ්පාදන සහනාධාර සැපයීම.

ඈ) සහල් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සමඟ බත් පරිභෝජන රුචිය අඩුවීම (ලකුණු 8)

## <u>ආ කොටස</u>

06). i. නිදහස් වෙළඳපොළ ක්‍රියාකාරීත්වයට රජය මැදිහත්වන ආකාර හා එමගින් වෙළඳපොල තුළ සිදුවන වෙනස්කම් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

ii.




ඉහත රූප සටහනෙන් පෙන්නුම් කරන්නේ සමතුලිතතාවයේ පවතින වෙළඳපොලකට රජය මැදිහත් වී නිෂ්පාදකයා වෙත ඒකක බද්දක් පැන වූ විට වෙළඳපල තුළ ඇතිවන තත්ත්වයකි. ඒ ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ) බද්දට පෙර පාරිභෝගික අතිරික්තය සොයන්න.

ආ) බද්දට පසු නිෂ්පාදන අතිරික්තය කොපමණද?

ඇ) ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම කොපමණද?

ඉ) පාරිභෝගිකයා හා නිෂ්පාදකයා දරන මුළු බදු ප්‍රමාණය කොපමණද?

ඊ) බද්ද නිසා අහිමි වන සමාජ සුබසාධනය සොයන්න. (ලකුණු 2 බැගින් ලකුණු 10)

iii. වෙළඳපොලේ ඒකක බද්දක් නිෂ්පාදකයා වෙත පැන වූ විට මුළු බදු බරම පාරිභෝගිකයා දරණ අවස්ථා දෙකක් රූප සටහන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 6)

07). i. ඒකක බදු පැනවීම නිසා පහත දැකවෙන තත්ත්වයන් ඇතිවන්නේ කවර ඉල්ලුම් නම්‍යතාවයන්හිදීද?

අ) බදු බර වැඩියෙන් පාරිභෝගිකයා දරණ අවස්ථාව

ආ) බදු බර වැඩියෙන් නිෂ්පාදකයා දරණ අවස්ථාව (ලකුණු 2)

ii. භාණ්ඩයකට නිෂ්පාදන බද්දක් පැනවූ විට සැපයුම් වක්‍රයෙහි කිසිදු වෙනසක් නිදු නොවන්නේ කුමන සැපයුම් නම්‍යතාවයකදීදැයි රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii. භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත පරිදි වේ යැයි සිතන්න.

Qd = 120 + 4P

Qs = 60 + 4P

මෙම භාණ්ඩයට රු. 2.00 ක ඒකක බද්දක් නිෂ්පාදකයා වෙත නියම කරන විට සමතුලිත මිල හා ප්‍රමාණය වෙනස් වන ආකාරය ගණනය කර පෙන්වන්න. (ලකුණු 4)

iv. සැපයුම්කරු වෙත බද්දක් පැනවූ විට ඇතිවන ප්‍රතිවිපාක 4 ක් දක්වන්න. (ලකුණු 4)

v. ගැනුම්කරුවෙත බද්දක් පැන වූ විට ඇතිවන ප්‍රතිවිපාක 4 ක් ලියන්න. (ලකුණු 4)

08). i. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් ශ්‍රිත දෙකකි.

Qd = 100 + 4P

Qs = -30 + 4P

මෙම භාණ්ඩයට නිෂ්පාදන ඒකකයක් වෙනුවෙන් රු. 5 ක සහනාධාරයක් ලාබදිමට රජය තීරණය කරයි.

අ) සහනාධාරයට පසු සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 4)

ආ) සහනාධාරය ලබාදීම සඳහා රජයට කොපමණ පිරිවැයක් දරන්නට සිදුවේද? (ලකුණු 2)

ඇ) සහනාධාරයට පසු ගැනුම්කරු ගෙවන මිලත් සැපයුම්කරුට ලැබෙන මිලත් කොපමණවේද? (ලකුණු 4)

ii. පොල් සඳහා ඇස්තමේන්තු කරන ලද වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.

Qd = 500 + 10P

Qs = -100 + 20P

අ) වෙළඳපොල ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාරයක අඳින්න. (ලකුණු 4)

ආ) සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කරන්න. (ලකුණු 2)

ඇ) රජය මෙම වෙළඳපොලේ පොල් ගෙඩියකට රු. 25.00 ක සහතික මිලක් නිෂ්පාදකයින්ට ලබාදිමට තීරණය කරයි නම් මෙම තත්වය යටතේ වෙළඳපොලට සපයන පොල්ගෙඩි ප්‍රමාණය කොමපණද? (ලකුණු 2)

ඉ) මුළු පොල් ප්‍රමාණය වෙළඳපොලට සැපයූ පසු වෙළඳපොල මිල කොපමණ වේද? (ලකුණු 2)

09). i. තරගකාරී සහල් වෙළඳපලට රජය මැදිහත්ව මිල උපරිමයක් නියම කළහොත් ඇතිවිය හැකි ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 4)

ii. භාණ්ඩයක මිල 0 දී ඉල්ලුම් ප්‍රමාණය 600 කි. මිල රු. 15 දී ඉල්ලුම් ප්‍රමාණය 300 කි. සැපයුම ඒකීය නම්‍ය වන අතර රු. 15 දී වෙළඳපොල සමතුලිත වේ. මෙම භාණ්ඩයට රජය රු. 10 ක උපරිම මිලක් නියම කරයි. මෙම තොරතුරු ප්‍රස්තාරයක් මගින් දක්වන්න. අධි ඉල්ලුම් ප්‍රමාණය හා උපරිම කළුකඩ මිල කොපමණ වේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 5)

iii. රජයේ මිල පාලනය යටතේ අවම මිල යන්නෙන් කුමක් අදහස් වේදැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv. අවම මිලක් අර්ථවත් කිරීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 3)

v. අවම මිලක ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 2)

vi. ඌන පූර්ණ ගෙවීමක් යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 3)

10). i. හීනවන ඵලදා නීතිය යන්න පැහැදිලි කර එය පදනම් කර ගන්නා උපකල්පන දක්වන්න. (ලකුණු 4)

ii. කෙටි කාලයේ දී මුළු නිෂ්පාදිතය, සාමාන්‍ය නිෂ්පාදිතය හා ආන්තික නිෂ්පාදිතය යන වක්‍රවල (ඵලදා වක්‍ර) හැසිරීම ප්‍රස්තාර සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iii. පරිමාණානුකූල ඵල නීතිය පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv. ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැයඅතර වෙනස නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. ගණකාධිකරණ පිරිවැය ආර්ථික පිරිවැයෙන් කෙසේ වෙනස් වන්නේ දැයි පැහැදිලි කරන්න.(ලකුණු 4)

## 2018 දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය

## ආර්ථික විද්‍යාව

## <u>පිළිතුරු පත්‍රය</u>

### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 3 | 11) | 5 | 21) | 1 | 31) | 4 | 41) | 1 |
| 2) | 1 | 12) | 1 | 22) | 2 | 32) | 3 | 42) | 1 |
| 3) | 2 | 13) | 4 | 23) | 1 | 33) | 4 | 43) | 4 |
| 4) | 4 | 14) | 4 | 24) | 3 | 34) | 4 | 44) | 1 |
| 5) | 2 | 15) | 1 | 25) | 5 | 35) | 2 | 45) | 5 |
| 6) | 3 | 16) | 3 | 26) | 2 | 36) | 3 | 46) | 3 |
| 7) | 1 | 17) | 3 | 27) | 4 | 37) | 2 | 47) | 2 |
| 8) | 5 | 18) | 2 | 28) | 3 | 38) | 3 | 48) | 3 |
| 9) | 2 | 19 | 5 | 29) | 1 | 39) | 5 | 49) | 5 |
| 10) | 4 | 20 | 4 | 30) | 3 | 40) | 2 | 50) | 3 |

## II කොටස

### <u>අ කොටස</u>

**01). i. ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**ii. ප්‍රාග්ධනය යනුවෙන් කුමක් අදහස් වේද? ඒ සඳහා උදාහරණ මොනවාද? (ලකුණු 4)**
**iii. මානව ප්‍රාග්ධනය හා සමාජ ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**
**iv. සම්පත් හිඟකම යනුවෙන් කුමක් අදහස් වේද? ඒ සඳහා බලපාන හේතු මොනවාද? (ලකුණු 4)**
**v. නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව යන්න නිර්වචනය කොට නිෂ්පාදන සාධකවල ඵලදායිතාව තීරණය කරන සාධක නම් කරන්න. (ලකුණු 4)**

**i.** - ආර්ථික සම්පත් ලෙස නිර්වචනය වන්නේ සමාජයේ අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සැපයුම සීමාසහිත හෝ හිඟකමක් හෝ ඇති නිෂ්පාදන සාධක වේ. හිඟකමක් ඇතිබැවින් ආර්ථික සම්පත් උපයෝජනය කිරීමේදී ආවස්ථික පිරිවැයක් හටගනී. උදා - භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය **(ලකුණු 2)**

- ආර්ථික නොවන සම්පත් ලෙස නිර්වචනය වන්නේ සමාජයේ මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව අසීමිත සැපයුමක් ඇති සම්පත් වේ. මේවා අසීමිතව පවතින බැවින් උපයෝජනය කිරීමේදී ආවස්ථික පිරිවැයක් හෝ මිලක් ඇති නොවේ. නිෂ්පාදනය සඳහා යොදාගත හැකි හිඟකමක් රහිත සම්පත් මෙයට අදාල වේ. උදා - හිරුඑළිය, වාතය, **(ලකුණු 2)**

**ii.** ප්‍රාග්ධනය යනුවෙන් අදහස් වන්නේ මිනිසා විසින් නිෂ්පාදිත භාවිතයේදී ක්ෂයවන නැවත ප්‍රතිසම්පාදනය කළහැකි නිෂ්පාදන ආධාරක වේ. **(ලකුණු 2)**

උදා : කර්මාන්තශාලා - ස්ථාවර ගොඩනැගිලි
යන්ත්‍රෝපකරන - ගුවන් තොටුපොල
වරාය - වාරිමාර්ග
මහාමාර්ග - දිගුකාලීන වගා
වැඩට පුහුණුකලයුතු **(උදා-4 ක් සඳහා ලකුනු 2)**

**iii.** - මානව ප්‍රාග්ධනය යනු ශ්‍රමිකයින් වෘත්තීයක් තුළ වඩාත් ඵලදායී වීමට උදව්වන්නා වූ අධ්‍යාපනය පුහුණුව, පර්යේෂණ, අත්දැකීම් කුසලතා හා පෞරුෂත්ව ගති ලක්ෂණ වලින් සැදුම්ලත් ශ්‍රමයේ නිපුණතාවයයි.**(ල. 4)**

- සමාජයේ අන්තර් සම්බන්ධතා වර්ධනය කෙරෙන ආයතන, ප්‍රතිමාන, අන්තර් පුද්ගල සම්බන්ධතා ජාලයන් සමාජ ප්‍රාග්ධන ලෙස හැඳින්වේ. උදා - මරණාධාර සමිති ගොවි සංවිධාන **(ල.2)**

**iv.** - සම්පත් හිඟකම යනු අසීමිත මිනිස් වුවමනා වලට සාපේක්ෂව සම්පත්වල පවත්නා ඌණතාවය හෙවත් සම්පත් ප්‍රමාණවත් නොවීමයි.

- සම්පත් නැත යන්න මෙයින් අදහස් නොවේ. මෙම සංකල්පය සෑම සමාජයකටම පොදු වූ සංකල්පයකි.
- එබැවින් සම්පත් හිඟකමක් නොමැති රටක කිසිදු ආර්ථික භාණ්ඩයක් තිබිය නොහැකිය. **(ල 2)**
- හේතු - මිනිස් වුවමනා අසීමිත වීම, පවතින සම්පත් ප්‍රමාණය සීමිත වීම, සම්පත්වල විකල්ප පැවතීම **(ල.2)**

**v.** - සම්පත්වල ඵලදායිතාවය යනු කිසියම් යෙදවුම් ඒකකයකින් ලබාගත හැකි නිමැවුම් ප්‍රමාණයයි.

- යෙදවුමකින් ලැබෙන මුළු නිමවුම නොවේ.
- ඵලදායිතාවය = $\frac{\text{නිමවුම් ඒකක ගණන}}{\text{යෙදවුම් ඒකක ගණන}}$

**ඵලදායිතාවය තීරණය කරන සාධක**

- තාක්ෂණය , මානව ප්‍රාග්ධනය, කළමනාකරණය, ශ්‍රම විභජනනය සහ විශේෂීකරණය (ල. 4)

---

02). **i.** **ආර්ථික පද්ධතියක් යනුවෙන් කුමක් අදහස් වේද?** (ලකුණු 2)

**ii.** **ආර්ථික පද්ධතියක තීරණ ගන්නා පාර්ශව මොනවාද?** (ලකුණු 2)

**iii.** **වෙළඳපොල ආර්ථිකයක පවත්නා දුර්වලතා විමසන්න** (ලකුණු 2)

**iv.** **ආර්ථික පද්ධති පිළිබඳ නව ප්‍රවණතා මොනවාද?** (ලකුණු 2)

**v.** **වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය නිර්වචනය කර ඒ සඳහා බලපාන සාධක පැහැදිලි කරන්න.** (ලකුණු 4)

**vi.** **පහත දැක්වෙන සංකල්ප නිෂ්පාදන හැකියා වක්‍ර මගින් පැහැදිලි කරන්න.**

**අ) ආර්ථික කාර්යක්ෂමතාව**

**ආ) ආර්ථික පසුබැසීම**

**ඇ) ආර්ථික වෘද්ධිය**

**ඈ) දැඩි ඉඩෝරයක් නිසා නිෂ්පාදන හැකියාව** (ලකුණු 8)

---

**i.** මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජයක් තුළ ජීවත්වන මිනිසුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇති සාන්ත්‍රණය හෙවත් ආයතනික වැඩ පිළිවෙළ ආර්ථික පද්ධතියක් ලෙස හැඳින්වේ. (ලකුණු 2)

**ii.** - කුටුම්බ - ආණ්ඩුව - ව්‍යාපාරික අංශය - කම්කරු සංවිධාන - රාජ්‍ය නොවන සංවිධාන

(කරුණකට 1 බැගින් ල. 2)

**iii.**
- සම්පත් කාර්යක්ෂම බෙදූ නොහැරිම
- පොදු භාණ්ඩ නොසැපයීම
- ශුභ සාධන භාණ්ඩ ප්‍රමාණවත් ලෙස නොසැපයීම
- බාහිරතා නොසැලකීම
- සාධාරණත්වයක් නොමැතිවීම
- සාර්ව ආර්ථික අසමතුලිතතාව (කරුණකට ල. 1 බැගින් ලකුණු 2)

**iv.**
- සමාජීය වෙළඳපොල ආර්ථිකය
- සමාජවාදී වෙළඳපොල ආර්ථිකය
- සංඥක සැලසුම් කරණ ආර්ථිකය (කරුණකට ල. 1 බැගින් ලකුණු 2)
- නිෂ්පාදන හැකියා මායිම මත ගමන් කිරීමේදී නිෂ්පාදනය එක් භාණ්ඩයක සමාන ප්‍රමාණයක් වැඩිකරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවන තත්වයක් වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය ලෙස හැඳින්වේ.


ඒ සඳහා පහත සාධක බලපායි.

-සම්පත් සමජාතීය නොවීම


- එක් නිෂ්පාදනයක් සඳහා යොදගන්නා සම්පත් අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනය සඳහා පූර්ණ ආදේශ නොවීම

(ලකුණු 4)


**v.** අ)





ආ)




ඇ)



ඈ) 


(2 බැගින් ලකුණු 8)

---

03). **i.** **ඉල්ලුම් නීතිය යනුවෙන් කුමක් අදහස්වේද?** **(ලකුණු 2)**

**ii.** **භාණ්ඩයක මිල ඉහළයනවිට සැපයුම් ප්‍රමාණය ඉහළයාමට හේතු පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

**iii.** **අනම්‍ය ඉල්ලුමක් පවතින අවස්ථාවක මිල හා පාරිභෝගික පැහැදම හැසිරෙන ආකාරය සංඛ්‍යාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 6)**

**iv.** **ගිෆන් භාණ්ඩ හා බාල භාණ්ඩ අතර වෙනස රූප සටහන් මගින් පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

**v.** **සැපයුම් මිල නම්‍යතා තීරක මොනවාද?** **(ලකුණු 4)**

---

**i.** යම් දෙන ලද නිශ්චිත අවස්ථාවක දී ඉල්ලුම කෙරෙහි බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර පවතින ප්‍රතිලෝම හෙවත් ඍණ සම්බන්ධතාවය ඉල්ලුම් නීතිය ලෙස හැදින්වේ. **(ලකුණු 2)**

**ii.** - භාණ්ඩ මිල ඉහළයන විට සැපයුම් ප්‍රමාණය ඉහළ යාමට හේතුව වන්නේ වැඩිවන ආන්තික පිරිවැය නීතිය ආවස්ථික පිරිවැය නීතිය වේ.

- කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිපදවන විට එහි ආවස්තික පිරිවැයද ඉහළ යන බව වැඩිවන ආන්තික පිරිවැය නීතියෙන් කියැවේ. නිමවුම වැඩිවන විට ආන්තික පිරිවැය පියවා ගැනීමට හැකිවන පරිදි භාණ්ඩයේ මිල ඉහළ නගිනවානම් පමණි. **(ලකුණු 4)**


**iii.** - අනම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයක මිල ඉහළ යනවිට පාරිභෝගික පැහැදම වැඩිවන අතර මිල පහළ යනවිට පාරිභෝගික පැහැදම වැඩිවන අතර මිල පහළ යන විට පාරිභෝගික පැහැදම පහළයයි. ඒ අනුව පවතින විටකදී මිල හා පාරිභෝගික පැහැදම අතර පවතින්නේ අනුලෝම හෙවත් ධන සම්බන්දතාවයකි.

- ඒ බව පහත ලේඛණ මගින් පැහැදිලි වේ.

| **P (මිල)** | **Qd ඉල්ලුම් ප්‍රමාණය** | **පාරිභෝගික පැහැදම** |
|---|---|---|
| 10 | 10 | 100 |
| 12 | 9 | 108 |


- අනම්‍ය ඉල්ලුමක් ඇතිවිටක මිල රු. 10.00 සිට රු. 12.00 දක්වා ඉහළ යනවිට පාරිභෝගික පැහැදම 100 සිට 108 දක්වා ඉහළ යයි.
- අනම්‍ය ඉල්ලුමක් ඇති විටක මිල රු. 12.00 සිට රු. 10.00 දක්වා පහල යන විට පාරිභෝගික පැහැදම 108 ක සිට රු.100 දක්වා අඩුවේ. **(අනම්‍ය ලේඛනයක් මගින් පැහැදිලිකිරීම ලකුණු 6)**

**iv.** - ගිෆන් භාණ්ඩ යනු ඉල්ලුම කෙරෙහි බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී භාණ්ඩයක මිල ඉහළ යනවිට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවන මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවන මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර අනුලෝම හෙවත් ධන සම්බන්දතාවයක් ඇති මිල ඉල්ලුම් නම්‍යතාවය + අගයක් ගන්නා භාණ්ඩ වේ.**(ලකුණු 1)** එය පහත රූප සටහන මගින් පැහැදිලි වේ.




**(ලකුණු 1)**

- බාල භාණ්ඩ යනු ඉල්ලුම කෙරෙහි බලපාන ආදායම හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී පුද්ගලයෙකුගේ ආදායම වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවන ආදායම අඩුවනවිට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවන භාණ්ඩ වේ. මෙම භාණ්ඩවල ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ඍණ අගයක් ගනී. (ල.1)
- බාල භාණ්ඩ ඉල්ලුම් වක්‍රය පහත පරිදි වේ. බාල භාණ්ඩ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.




**(ලකුණු 4)**

**v.** - සාධක සංචලන හැකියාව - තොග පවත්වා ගැනීමේ හැකියාව
- මිල වෙනස් වීමෙන් පසු ගත වූ කාලය - සම්පත් සැපයුමේ නම්‍ය අනම්‍ය වි **(ලකුණු 4)**


---

04). **Qd = 250 – 5P**
**Qs = 50 + 5P**

**i.** **ඉහත සමීකරණවලට අදාල භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය රූප සටහනක ඇතුලත් කරන්න. (ලකුණු 4)**
**ii.** **අධි ඉල්ලුම් සමීකරණය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 4)**
**iii.** **එම වෙළඳපලේ මුළු ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)**
**iv.** **රු. 8 දී අධි ඉල්ලුම් ප්‍රමාණය කොපමණද? (ලකුණු 2)**
**රු. 8 දී අධි ඉල්ලුම් මිල කොපමණද? (ලකුණු 2)**
**v.** **මෙම භාණ්ඩයේ උපරිම ඉල්ලුම් මිල ගණනය කරන්න (ලකුණු 2)**
**vi.** **ඉහත වෙළඳපලේ භාණ්ඩයට අදාළ සැපයුම් නම්‍යතාව පිළිබඳ අදහස් දක්වන්න (ලකුණු 2)**

---

04). **i.**




**(නිවැරදි රූපසටහනට ලකුණු 4)**

**ii.** Qd – Qs
250 – 5P – (50 + 5P)
200 – 10 P **(ලකුණු 4)**

**iii.** ආර්ථික අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදන අතිරික්තය

$= \frac{30\,x\,150}{2} + \frac{50+150+20}{2}$

= 2250 + 2000 = 4250 **(ලකුණු 4)**

**iv.** රු. 8 දී අධි ඉල්ලුම් ප්‍රමාණය - මිල රු. 8 දී අධි ඉල්ලුම් මිල

Qd - Qs
250 – 5P – ( 50 + 5P)
250 – 5 x 8 – 50 + 5 x 8
210 – 90 = 120

රු. 8 දී QS = 90
ඒකක 90ක් ඉල්ලුම් කරන මිල
Qd = 250-5P / 90 = 250 – 5P
-5P = 250 – 90 / -5P = 160 / 5 = $\frac{160}{5}$
P = 32 (අධි ඉල්ලුම් මිල) **(ලකුණු 2)**

**v.** උපරිම ඉල්ලුම් මිල
Qd = 250 – 5P
0 = 250 -5P
$\frac{5P}{5} = \frac{250}{5}$
$P = \frac{250}{5}$
P = 50 **(ලකුණු 2)**

**vi.** - ඉහත වෙළඳපොලේ සැපයුම් වක්‍රයේ නම්‍යතාවය අනම්‍ය වූ එකකි. මෙම සැපයුම් සමීකරණයේ මිල ශුන්‍ය වූ විට සපයන ප්‍රමානය ඒකක 50 ක් වන බැවින් සහ වක්‍රයේ බෑවුම සීඝ්‍ර බැවින් අනම්‍ය සැපයුමක් යැයි කිව හැකිය.
- මෙම සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට සැපයුම් නම්‍යතාවයද ඉහලයයි. **(ලකුණු 2)**

**05). i. නිෂ්පාදන අතිරික්තය යනුවෙන් කුමක්ද අදහස් වේද?**
**රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**ii. වෙළඳපොළ සමතුලිතය ඇති කොන්දේසි මොනවාද? (ලකුණු 4)**


**iii. Qd = 50 – 2P**
**Qs = - 10 + 2P**
**අ) සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)**
**ආ) මෙම භාණ්ඩයේ අවම සැපයුම් මිල ගණනය කරන්න. (ලකුණු 2)**

**iv. පහත සඳහන් සිද්ධි සමතුලිත සහල් වෙළඳපොලකට සිදුකරන බලපෑම රූ සටහන් මගින් පැහැදිලි කරන්න.**
**අ) පාන් මිල ඉහළ යාම**
**ආ) බත් පරිභෝජනය කරන අය වැඩිවීම.**
**ඇ) සහල් සඳහා රජය නිෂ්පාදන සහනාධාර සැපයීම.**
**ඈ) සහල් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සමඟ බත් පරිභෝජන රුචිය අඩුවීම (ලකුණු 8)**

---

**i.** - නිෂ්පාදන අතිරික්තය යනු සමතුලිත හුවමාරුවේදී සැපයුම් කරුවන් භාණ්ඩ සඳහා අපේක්ෂා කළ අවම මිල හෙවත් ආන්තික පිරිවැය හා ඇත්ත වශයෙන් ඒ සඳහා ඔවුන්ට වෙළෙඳපලේ දී ලැබෙන වෙනස්කම් වල සමුච්ත අගයයි.

- නිෂ්පාදකයාගේ මුළු අයහාරයෙන් විචල්‍ය පිරිවැය අඩුකළ විට නිෂ්පාදන අතිරික්තය ලැබේ. **(ල.2)**




$$\text{නි.අ.} = \frac{Aq \times \Delta P}{2}$$
$$= \frac{10 \times 20}{2}$$
$$= \underline{100}$$

(ලකුණු 2)

**ii.** - අපේක්ෂිත ඉල්ලුම් මිල හා අපේක්ෂිත සැපයුම් මිල සමානවීම
- අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය හා අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය සමානවීම
- අධි ඉල්ලුම හා අධි සැපයුම සමානවීම
- පාරිභෝගික සැපයුම හා නිෂ්පාදන අයහාරය සමානවීම **(කරුණු 4 ක් සඳහා ලකුණු 4)**

**iii.** අ) Qd = 50 – 2P
Qs = - 10 + 2P
P = 15
Qd = 20

$$Edp = b \times \frac{P}{Q}$$
$$= -2 \times \frac{15}{20}$$
$$= \underline{-1.5}$$


(ලකුණු 2)

**ආ)** අවම සැපයුම් මිල
Qs = -10+2P

$$\frac{-2P}{-2} = \frac{-10+2P}{-2}$$
$$\underline{P = 5}$$

(ලකුණු 2)


**iv.** අ)




(ල.1)

- සමතුලිත සහල් වෙළෙඳ පොලක පාන් මිල ඉහළ ගිය විට පාන් ආදේශන භාණ්ඩයක් බැවින් සහල් ඉල්ලුම වැඩිවී ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වේ. එවිට සහල් සමතුලිත මිල වැඩිවී සමතුලිත ප්‍රමාණය වැඩිවේ. (ල.1)


ආ)




(ල.1)

- සමතුලිත සහල් වෙළෙඳ පොලක් බත් පාරිභෝගික සංඛයාව ඉහළ ගියවිට සහල් ඉල්ලුම වැඩිවී සහල් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වේ. සහල් සමතුලිත මිල P සිට $P_1$ දක්වා ඉහළ යන අතර සමතුලිත සහල් ප්‍රමාණය Q සිට $Q_1$ දක්වා ඉහළ යයි. (ල.1)


ඇ)




- සහනාධාර සැපයූ විට සැයමුම් වක්‍රය දකුණට විතැන්වී සමතුලිත මිල පහළ යයි. සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.

(ලකුණු 1) (ලකුණු )

ඇ)




- සමතුලිත සහල් වෙළෙඳපොලක නිෂ්පාදනන පිරිවැය ඉහළ ගිය විට සැපයුම අඩුවී සැපයුම් වක්‍රය වමට විතැන්වේ. බත් පාරභෝජන රුචිය අඩුවූ විට ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ. මෙම ඉල්ලුම සහ සැපයුම සමාන ප්‍රමාණයෙන් අඩුවූ විට සමතුලිත මිල නොවෙනස්ව තිබියදී සමතුලිත ප්‍රමාණය අඩුවේ.
- ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍ර අසමාන ලෙස අඩුවූ විටක සමතුලිත ප්‍රමාණය අඩුවන අතර මිල වෙනස්වීම නිෂ්චිතව කිව නොහැකිය.


(ල.1) (ල.1)

<u>ආ කොටස</u>

---

06). **i.** **නිදහස් වෙළඳපොළ ක්‍රියාකාරීත්වයට රජය මැදිහත්වන ආකාර හා එමගින් වෙළඳපොල තුළ සිදුවන වෙනස්කම් 2 ක් සඳහන් කරන්න.** **(ලකුණු 4)**

**ii.**




**ඉහත රූප සටහනෙන් පෙන්නුම් කරන්නේ සමතුලිතතාවයේ පවතින වෙළඳපොලකට රජය මැදිහත් වී නිෂ්පාදකයා වෙත ඒකක බද්දක් පැන වූ විට වෙළඳපල තුළ ඇතිවන තත්ත්වයකි. ඒ ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**අ) බද්දට පෙර පාරිභෝගික අතිරික්තය සොයන්න.**
**ආ) බද්දට පසු නිෂ්පාදන අතිරික්තය කොපමණද?**
**ඇ) ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම කොපමණද?**
**ඉ) පාරිභෝගිකයා හා නිෂ්පාදකයා දරන මුළු බදු ප්‍රමාණය කොපමණද?**
**ඊ) බද්ද නිසා අහිමි වන සමාජ සුබසාධනය සොයන්න.** **(ලකුණු 2 බැගින් ලකුණු 10)**

**iii.** **වෙළඳපොලේ ඒකක බද්දක් නිෂ්පාදකයා වෙත පැන වූ විට මුළු බදු බරම පාරිභෝගිකයා දරණ අවස්තා දෙකක් රූප සටහන් මගින් පෙන්වා දෙන්න.** **(ලකුණු 6)**

---

**i.** - බදු පැනවීම - සහනාධාර ලබාදීම - මිල පාලනය - මිල ස්ථායිකරණය **(ලකුණු 2)**

**වෙළඳපල තුළ සිදුවන වෙනස්කම්**

- සමතුලිත මිල හා ප්‍රමාණය වෙනස්වීම
- පාරිභෝගික අතිරික්තය වෙනස්වීම
- නිෂ්පාදන අතිරික්තය වෙනස්වීම **(ල.2)**

**ii.** **අ)** බද්දට පෙර පාරි. අතිරික්තය = <u>(උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය</u> / 2

$$\frac{(30-15)\,x\,300}{2} \quad = 2250$$

**ආ)** බදු පසු නිෂ්පාදන අතිරික්තය $\frac{12.50\,x\,250}{2}$ = <u>1562.50</u>

**ඇ)** රජයට ලැබෙන ආදායම 5 x 250 = <u>1250</u>


**ඉ)** පාරිභෝගිකයා දරණ බදු ප්‍රමාණය 17.50 – 15 = <u>2.50</u>

ඊ) <u>ඒකක බද්ද x සමතුලිත ප්‍රමාණයේ වෙනස</u>
2

$\frac{5 \times 50}{2} = \frac{250}{2} = \underline{\underline{125}}$ **(ලකුණු 2 බැගින් ලකුණු 10)**


**iii.** මුළු බදු බරම පාරිභෝගියා දරණ අවස්ථා **(ලකුණු 6)**

ඉල්ලුම පූර්ණ අනම්‍ය **(ලකුණු 1)**




**(ලකුණු 2)**

පූර්ණ නම්‍ය සැපයුම **(ලකුණු 1)**




**(ලකුණු 2)**

**(ලකුණු 2 බැගින් ලකුණු 6)**

---

**07). i.** **ඒකක බදු පැනවීම නිසා පහත දැකවෙන තත්ත්වයන් ඇතිවන්නේ කවර ඉල්ලුම් නම්‍යතාවයන්හිදීද?**
**අ) බදු බර වැඩියෙන් පාරිභෝගිකයා දරණ අවස්ථාව**
**ආ) බදු බර වැඩියෙන් නිෂ්පාදකයා දරණ අවස්ථාව** **(ලකුණු 2)**

**ii.** **භාණ්ඩයකට නිෂ්පාදන බද්දක් පැනවූ විට සැපයුම් වක්‍රයෙහි කිසිදු වෙනසක් නිදු නොවන්නේ කුමන සැපයුම් නම්‍යතාවයකදීදැයි රූප සටහන් මගින් පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

**iii.** **භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත පරිදි වේ යැයි සිතන්න.**
**Qd = 120 - 4P**
**Qs = 60 + 4P**
**මෙම භාණ්ඩයට රු. 2.00 ක ඒකක බද්දක් නිෂ්පාදකයා වෙත නියම කරන විට සමතුලිත මිල හා ප්‍රමාණය වෙනස් වන ආකාරය ගණනය කර පෙන්වන්න.** **(ලකුණු 4)**

**iv.** **සැපයුම්කරු වෙත බද්දක් පැනවූ විට ඇතිවන ප්‍රතිවිපාක 4 ක් දක්වන්න.** **(ලකුණු 4)**


**v.** **ගැනුම්කරුවෙත බද්දක් පැන වූ විට ඇතිවන ප්‍රතිවිපාක 4 ක් ලියන්න.** **(ලකුණු 4)**

---

**i.** අ) - බදු බර වැඩියෙන් පාරිභෝගිකයා දරන්නේ
- ඉල්ලුම් නම්‍යතාව එකට අඩුවූ විටයි. එනම් අනම්‍ය ඉල්ලුම් තත්ත්වයකදීය **(ලකුණු 1)**

ආ)- බදු බර වැඩියෙන් නිෂ්පාදකයා දරන්නේ ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි වූ විටයි. එනම් නම්‍ය ඉල්ලුම් තත්ත්වයකදීය. **(ල.1)**

**ii.**




- ඒකක බද්දක් පැන වූ විට සැපයුම් වක්‍රයට කිසිදු වෙනසක් සිදු නොවන්නේ සැපයුම පූර්ණ අනම්‍ය වූ විටයි.
- පූර්ණ අනම්‍ය සැපයුමක් පවතින විට බද්දට පෙරත් පසුත් සමතුලිතයෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.
- මුළු බදු බරම නිෂ්පාදකයා විසින් දරණු ලැබේ.

**(රූප සටහනට ල. 2 පැහැදිලි කිරීමට ලකුණු 2)**

**iii.** මෙම භාණ්ඩයට ඒකක බද්ද පැනවීමට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය

Qd = Qs
120 – 60 = 4P + 4P
60 = 8 P
P = 7.50 සමතුලිත මිල

Qd = 120- 4P
= 120 – 4 x 7.50
Qd = 90 සමතුලිත ප්‍රමාණය (ල.1)

**බද්දට පසු සමතුලිත මිල හා ප්‍රමාණය**
Qs = 60 + 4P
ඒකක බද්ද රු. 2.00
Qst = 60 + 4 (P – 2)
=60 + 4 P – 8

Qst = 52 + 4 P බද්දට පසු සැපයුම් සමීකරණය (ල.1)

Qd = Qst
120 – 4P = 52 + 4P    Qd = 120 – 4 x 8.50
120 – 52 = 4P + 4P    120 – 34
68 = 8 P    Qd = 86 සමතුලිත ප්‍රමාණය
$P = \frac{68}{8} = 8.50$ සමතුලිත මිල (ල. 2)

- බද්දට පෙර සමතුලිත මිල 7.50
  බද්දට පසු සමතුලිත මිල 8.50
  සමතුලිත මිල රු. 1 කින් වෙනස් වේ. (ල.1)
- බද්දට පෙර සමතුලිත ප්‍රමාණය ඒකක 90
  බද්දට පසු සමතුලිත ප්‍රමාණය ඒකකය 86
  සමතුලිත ප්‍රමාණය ඒකක 4 කින් වෙනස් වේ. (ල.1) **(මුළු ලකුණු 6 යි)**

**iv.** - සැපයුම් පිරිවැය ඉහළයයි
- සැපයුම් වක්‍රය වමට විතැන්වේ.
- සමතුලිත මිලඉහළ යන අතර ප්‍රමාණය පහළ යයි
- පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය අඩුවේ. **( කරුණු 4 කට ලකුණු 4)**

**v.** - සැපයුම් වක්‍රයට කිසිදු බලපෑමක් සිදු නොවේ.
- ඉල්ලුම් වක්‍රය වමට විතැන්වේ.
- සමතුලිත මිල පහළ යයි
- සමතුලිත ප්‍රමාණය පහළ යයි. **( කරුණු 4 කට ලකුණු 4)**

---

08). **i. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් ශ්‍රිත දෙකකි.**

**Qd = 100 - 4P**

**Qs = -30 + 6P**

**මෙම භාණ්ඩයට නිෂ්පාදන ඒකකයක් වෙනුවෙන් රු. 5 ක සහනාධාරයක් ලාබදීමට රජය තීරණය කරයි.**

**අ) සහනාධාරයට පසු සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.** (ලකුණු 4)

**ආ) සහනාධාරය ලබාදීම සඳහා රජයට කොපමණ පිරිවැයක් දරන්නට සිදුවේද?** (ලකුණු 2)

**ඇ) සහනාධාරයට පසු ගැනුම්කරු ගෙවන මිලත් සැපයුම්කරුට ලැබෙන මිලත් කොපමණවේද?** (ලකුණු 4)

**ii. පොල් සඳහා ඇස්තමේන්තු කරන ලද වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.**

**Qd = 500 - 10P**

**Qs = -100 + 20P**

**අ) වෙළඳපොල ඉල්ලුම් සැපයුම් වක්‍ර ප්‍රස්තාරයක අඳින්න.** (ලකුණු 4)

**ආ) සමතුලිත මිල හා ප්‍රමාණය ලකුණු කරන්න.** (ලකුණු 2)

**ඇ) රජය මෙම වෙළඳපොලේ පොල් ගෙඩියකට රු. 25.00 ක සහතික මිලක් නිෂ්පාදකයින්ට ලබාදීමට තීරණය කරයි.** (ලකුණු 2)

**ඉ) මුළු පොල් ප්‍රමාණය වෙළඳපොලට සැපයූ පසු වෙළඳපොල මිල කොපමණ වේද?** (ලකුණු 2)

---

**i.** අ) සහනාධාරයට පසු සමතුලිත මිල හා ප්‍රමාණය

Qd = 100 – 4 P
Qs = -30 + 6P
Qs = -30 + 6 (P+5)
= -30 + 6P+30 (ල. 1)

$\frac{Qs = 6P}{Qd = Qs}$

100 – 4 P = 6P
100 + 6P + 4P
100 = 10P = P = 10 සහනාධාරයට පසු සමතුලිත මිල (ල.2)


Qd = 100 – 4 x 10
100 – 40 = Qd = 60 සහනාධාරයට පසු සමතුලිත මිල (ල.1)

ආ) රජයේ පිරිවැය 5 x 60 = රු. 300 (ල.2)

ඇ) සහනාධාරයට පසු ගැනුම්කරු ගෙවන මිල = රු. 10 යි (ල.2)

සහනාධාරයට පසු සැපයුම්කරුට ලැබෙන මිල = 10+5 = 15 (ල.2)

**ii.** අ)



(ලකුණු 4)

ආ) සමතුලිත මිල රු. 20 යි **(ලකුණු 1)** සමතුලිත ප්‍රමාණය ඒකක 300 යි **(ල.1)**

ඇ) පොල් ගෙඩි 400 යි **(ලකුණු 2)**

ඉ) පොල් මිල රු. 10 යි **(ලකුණු 2)**

---

**09). i. තරඟකාරී සහල් වෙළඳපලට රජය මැදිහත්ව මිල උපරිමයක් නියම කළහොත් ඇතිවිය හැකි ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 4)**

**ii. භාණ්ඩයක මිල 0 දී ඉල්ලුම් ප්‍රමාණය 600 කි. මිල රු. 15 දී ඉල්ලුම් ප්‍රමාණය 300 කි. සැපයුම ඒකීය නම්‍ය වන අතර රු. 15 දී වෙළඳපොල සමතුලිත වේ. මෙම භාණ්ඩයට රජය රු. 10 ක උපරිම මිලක් නියම කරයි. මෙම තොරතුරු ප්‍රස්තාරයක් මගේ දක්වන්න. අධි ඉල්ලුම් ප්‍රමානය හා උපරිම කළුකඩ මිල කොපමණ වේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 5)**

**iii. රජයේ මිල පාලනය යටතේ අවම මිල යන්නෙන් කුමක් අදහස් වේදැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**iv. අවම මිලක් අර්ථවත් කිරීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 2)**


**v. අවම මිලක ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 2)**

**vi. ඌන පූර්ණ ගෙවීමක් යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 3)**

---

**i.**
- අධි ඉල්ලුමක් ඇතිවේ
- එම නිසා වෙළඳපලභාණ්ඩ හිගයක් ඇතිවේ.
- කළු කඩ මිලකට භාණ්ඩ අලෙවි කිරීමට තැත් කරයි.
- සමතුලිත මිලට වඩා ඉහළ මිලකට භාණ්ඩ අලවේ කරයි.
- නිෂ්පාදන අතිරික්තයට හා පාරිභෝගික අතිරික්තයට අයහපත් බලපෑම ඇතිවේ. එමගින් සමාජ සුභසාධනයට හානි ඇතිවේ.
- එම භාණ්ඩ අදාළ ක්ෂේත්‍රයේ ආයෝජන සීමාවේ. **(ඕනෑම කරුණු 4 කට ලකුණු 4)**

**ii.**



**(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 3)**

- අධි ඉල්ලුම් ප්‍රමාණය = 400 - 200 = 200 **(ල.1)**
- උපරිම කළු කඩ මිල = රු.20යි **(ල.1)**

**iii.**
- අවම මිල නියම කිරීම යන්නෙන් අදහස් කරන්නේ ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වූ වෙළඳපල මිල නිෂ්පාදකයින්ට අසාධාරණ වෙතැයි යන විශ්වාසය මත නිෂ්පාදකයින්ට සාධාරණත්වයක් සැලසීම සඳහා ආණ්ඩුව විසින් සමතුලිත මිලට ඉහළින් නිත්‍යානුකලව නියම කරන මිලයි.
- සමතුලිතයට ඉහළින් නියම කරන අවම මිල සඵල අවම මිල නමින් හැඳින්වේ.

**උදා** - වී සඳහා අවම මිලක් නියම කිරීම , අවම වැටුප් අනුපාතිකය නියම කිරීම.

**(පැහැදිලි කිරීමට ල. 2 යි උදා. ලකුණු 1)**

**iv.** - අතිරික්තය ගබඩා කිරීම - අතුරු නිෂ්පාදනය - පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය - අපනයනය


**(කරුණු 3 ට ලකුණු 3)**

**v.** - අතිරික්තය නිෂ්පාදන වෙලෙඳපලේ ගොඩනැගීම (තොග සමුච්චනය)

- අවම මිල නාමික එකක් සේ සලකා අඩු මිලට භාණ්ඩ අලෙවි කිරීම
- අධි ආයෝජන තත්ත්වයක් ඇතිවීම
- විරැකියා තත්ත්වයක් ඇතිවීම
- පාරිභෝගික අතිරික්තයට නිෂ්පාදන අතිරික්තයට බලපෑම් ඇතිවී සමාජ සුභසාධනයටද බලපෑම් ඇතිවීම

**(ඕනෑම කරුණු 2 ට ලකුණු 2)**

**vi** - ඌණ පූර්ණ ගෙවීම් ක්‍රමය යනු අවම මිල සීමාව යටතේ නිෂ්පාදනකයන් වෙළඳපලට සැපයීමට කැමති මුළු භාණ්ඩ ප්‍රමාණයට පාරිභෝගිකයින් ගෙවීමට කැමති වෙළඳපොළ තීරණය වන මිලත් රජය විසින් පනවන ලද අවම මිලත් අතර ප්‍රමාණය රජය විසින් නිෂ්පාදකයාට ගෙවීමයි. එය ප්‍රස්ථාරයෙන් දක්වන්නේනම්, **(ල.3)**




**ප්‍රස්ථාරය මගින් පැහැදිලි කළත් ලකුණු ලැබේ.**

---

10). **i.** **හීනවන ඵලදා නීතිය යන්න පැහැදිලි කර එය පදනම් කර ගන්නා උපකල්පන දක්වන්න.(ලකුණු 4)**

**ii.** **කෙටි කාලයේ දී මුළු නිෂ්පාදිතය, සාමාන්‍ය නිෂ්පාදිතය හා ආන්තික නිෂ්පාදිතය යන වක්‍රවල (ඵලදා වක්‍ර) හැසිරීම ප්‍රස්තාර සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)**

**iii.** **පරිමාණානුකූල ඵල නීතිය පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**iv.** **ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැයඅතර වෙනස නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**v.** **ගණකාධිකරණ පිරිවැය ආර්ථික පිරිවැයෙන් කෙසේ වෙනස් වන්නේ දැයි පැහැදිලි කරන්න.. (ලකුණු 4)**

---


**i.** - හීනවන ඵලදා නීතිය මගින් පැහැදිලි කරන්නේ කෙටි කාලයේ නිමැවුමෙහි හැසිරීම් රටාවයි


- නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව එක්තරා පසුව පහළ යාම හීනවන ආන්තික ඵලදා නීතිය නමින් හැදින්වේ. **(ලකුණු 2)**

***උපකල්පන***

- සියලු විචල්‍ය යෙදවුම් ඒකක සමාජතීය වීම
- අදාල නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තාක්ෂණය නොවෙනස්ව පැවතීම **(ල. 2)**

**ii.**



- මුළු නිෂ්පාදිතය මුලදී වේගයෙන් ඉහළ ගොස් පසුව විචල්‍ය සාධක තවදුරටත් වැඩි කරන විට අඩු වීමේ ප්‍රවණතාවයක් ඇතිවේ.
- විචල්‍ය යෙදවුම් තවදුරටත් වැඩි කරත්ම උපරිම අවස්ථාවෙන් පසුව පහළ බසී.
- මුළු නිෂ්පාදිතය වේගයෙන් ඉහළ නගින අවස්ථාවේ ආන්තික හා සමාන්‍ය නිෂ්පාදිත ඉහළ යන අතර සාමාන්‍ය නිෂ්පාදිතය උපරිම වන විට එම ලක්ෂ්‍ය හරහා ආන්තික නිෂ්පාදිතය පහළ බසී.
- සාමාන්‍ය නිෂ්පාදිතය උපරිම අවස්ථාවෙන් පසු සාමාන්‍ය නිෂ්පාදිතයත් ආන්තික නිෂ්පාදිතයත් පහළ බසී.
- මුළු නිෂ්පාදිතය උපරිම වන විට ආන්තික නිෂ්පාදිතය ශුන්‍ය වේ.
- ආන්තික නිෂ්පාදිතය පහළ බසින විට තව දුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කරනවිට සාමාන්‍ය නිෂ්පාදිතය ඉහළ යයි. උපරිම අවස්ථාවට පසුව ආන්තික හා සමාන්‍ය නිෂ්පාදන වක්‍ර දෙකම පහළ බසී.

**(නිවැරදි ප්‍රස්ථාරවලට ල. 3යි. පැහැදිලි කිරීම කරුණු 2 ට ලකුණු 2)**

**iii.** - පරිමාණානුකුල ඵල නීතිය යනුවෙන් අදහස් කරන්නේ
දිගු කාලයකදී සියලුම යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනයේ යෙදීමට ආයතනයට හැකි නිසා සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වන විට නිමැවුම හැසිරෙන ආකාරය පරිමාණානුකුල ඵල නීතිය යන්නෙන් අදහස් වේ.
- දිගුකාලයේදී තම නිෂ්පදාන ආයතනයේ සමස්ත පරිමාව වෙනස් කිරීමට නිෂ්පාදන ආයතනයට හැකිය.
- පරිමාණානුකුල ඵල තුන් ආකාරවේ.
- වැඩෙන, හීනවන හා ස්ථාවර පරිමාණානුකුල වශයෙනි **(ලකුණු 3)**

**iv.** - නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කරනු ලබන ස්ථාවර සාධක සඳහා දරණ පිරිවැය ස්ථාවර පිරිවැය ලෙස හැඳින්වේ.
- කෙටි කාලයේදී ස්ථාවර පිරිවැය වෙනස් නොවේ. නොවැලැක්විය හැකිය.
- විචල්‍ය පිරිවැය යනු නිෂ්පාදක ක්‍රියාවලියට සම්බන්ධ කරන විචල්‍ය සාධක සඳහා දරන්නට සිදුවන පිරිවැයයි.
- කෙටි කාලීන පිරිවැය තුළ ඇතුලත් මුළුවිචල්‍ය පිරිවැය නිමැවුම සමඟ වෙනස් වේ. **(ලකුණු 2)**

නිදසුන් - ස්ථාවර පිරිවැය
- ක්‍රම ක්ෂය ගාස්තු, දේපල බදු, බලපත්‍ර ගාස්තු
- ප්‍රාග්ධන සඳහා පොලී. ප්‍රමාණික ලාභ **(ලකුණු 1)**

- විචල්‍ය පිරිවැය
- අමුද්‍රව්‍ය, ශ්‍රමයට වැටුප්, ඉන්දන, විදුලි ගාස්තු ආදිය (ල.1)

**v.** - ගණකාධිකාරිවරයෙකු පිරිවැයට ඇතුලත් කරන්නේ ඍජු පිරිවැය පමණි.
එනම් මූල්‍ය පිරිවැයයි.
ගිණුම්කරණ පිරිවැය = ඍජු පිරිවැය **(ල.1)**
- ආර්ථික පිරිවැය යනු ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය යන දෙකෙහිම එකතුවයි. **(ල.1)**
- ආර්ථික විද්‍යාවට අනුව නිෂ්පාදන පිරිවැය ලෙසින් සැලකෙන්නේ ආවස්ථික පිරිවැයයි (මූර්ථ පිරිවැය)
ආර්ථික පිරිවැය = ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය **(ල.1)**
- ආර්ථික විද්‍යාවේදී ලාභ ගණනයේදී ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය යන දෙකම සැලකිල්ලට ගනී
- ගිණුම්කරණයේදී ලාභ ගණනය කරන්නේ මුළු 'අයහාරයෙන් ඍජු පිරිවැය පමණක් අඩු කිරීමයි. **(ලකුණු 1)**